**දෙසැම්බර් 30**
**නත්තල් සතියේ පළමු සතිය**

පළමුවන දේව ප්‍රකාශනය 1 ජොහාන් 2 :12–17

ශුද්ධ වූ ජුවාම් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් ගත් කොටසකි.

දෙවියන් වහන්සේගේ කැමැත්ත කරන්නා සදහටම ජීවත් වන්නේය.

මාගේ ප්‍රියාදර දරුවෙනි, මා ඔබට ලියන්නේ උන් වහන්සේගේ නාමය නිසා ඔබේ පව් කමා කර ඇති බැවිනි. පියවරුනි, මා ඔබට ලියන්නේ, මූලාරම්භයේ සිට වැඩසිටින තැනැන් වහන්සේ ඔබ දන්නා බැවිනි. තරුණයිනි, මා ඔබට ලියන්නේ, ඔබ නපුරා දමනය කර ඇති බැවිනි. දරුවෙනි, මා ඔබට ලියා එවූයේ, ඔබ පියාණන් වහන්සේ දන්නා බැවිනි. පියවරුනි, මා ඔබට ලියා එවූයේ මූලාරම්භයේ සිට වැඩසිටින තැනැන් වහන්සේ ඔබ දන්නා බැවිනි. තරුණයෙනි, මා ඔබට ලියා එවූයේ, ඔබ ශක්තිමත් බැවිනුත්, දෙවියන් වහන්සේගේ වචනය ඔබ තුළ ඇති බැවිනුත්, ඔබ නපුරා දමනය කර ඇති බැවිනුත් ය. මේ ලෝකයට වත්, එහි ඇති දේ වලට වත් ඇලුම් නොකරන්න. යමෙක් ලෝකයට ඇලුම් කරන්නේ ද දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මන්ද, ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, කාමරාග, මාංසික තෘෂ්ණා, අහංකාරකම් ඇති වන්නේ පියාණන් වහන්සේගෙන් නොව ලෝකයෙන් ය. ලෝකයත් ලෝකානුරාගයත් පහ වී යන්නේය. එහෙත් දෙවියන් වහන්සේගේ කැමැත්ත කරන්නා සදහටම ජීවත් වන්නේය.

දේව වචනය මෙසේය.

පිළිතුරු ගීය ගීතාවලිය 96 : 7–10

ඔබගේ පිළිතුර: ස්වර්ගය ද මිහිතලය ද ප්‍රීති ප්‍රමෝද වේවා!

ගීය: සකල ජනයෙනි, සමිඳුන් පසසන්න.
ගෞරවය ද බලය ද සමිඳුන් හට පිරිනමන්න.
සමිඳුන් නමට හිමි ගෞරවය එතුමන් හට පිරිනමන්න.
පඬුරක් රැගෙන එතුමන් ඉදිරියට එන්න.

සමිඳුන් අබිමුව පාරිශුද්ධත්වයෙන් සැරසී වැඳ වැටෙන්න.
ලෝ වැසි සියල්ලෙනි එතුමන් අබිමුව බියෙන් ඇළැලී සිටින්න.
විජාතීන් අතර මෙසේ පවසන්න, “සමිඳාණෝ රජකම් කරන සේක.
නොසැලෙන ලෙස ලෝකය පිහිටා ඇත. එතුමාණෝ සාධාරණ ලෙස ජනතාවන් විනිශ්චය කරන සේක.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!

ශුද්ධවූ දිනයක් අපට උදා වූණේය.
සකල ජනයෙනි, සමිඳාණන් අබිමුව වැඳ වැටෙන්න.
මහත් ආලෝකයක් පොළොව මත පතිත වූණේය.

ආලේලූයා!

<u>සුවිශේෂය ලූක් 2: 36-40</u>

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

අන්නා, විමුක්තිය අපේක්ෂා කළ සියලු දෙනා හට
දෙවියන් වහන්සේ ගැන කථා කළාය.

ආෂෙර්ගේ පෙළපතින් ආ පානුවෙල්ගේ දුවනියක වන බොහෝ වයස්ගත අන්නා නම් දිවැසිවරයක් වූවාය. විවාහයෙන් පසු සත් වසක් සැමියා සමග විසූ ඈ අසූ හතර අවුරුද්දක් වයස්ගත වනතුරු වැන්දඹුවක් ව සිටියාය. ඈ දේව මාළිගාවෙන් ඉවත්ව නොගොස් දිවා රෑ දෙක්හි උපවාස හා යාච්ඤා පවත්වමින් නමස්කාර කළාය. ඈ ද ඒ මොහොතේ දීම අවුත්, දෙවියන් වහන්සේට තුති පුදා, ජෙරුසලමේ විමුක්තිය අපේක්ෂා කළ සියලු දෙනා හට උන් වහන්සේ ගැන කතා කළාය. ජෝසෙප් සහ මරියා සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථාවලිය අනුව සියල්ල ඉටු කළ පසු ගලීලයේ නාසරෙත් නම් සිය නුවරට පෙරළා ගියහ. දරුවා වැඩී ශක්තිමත් ව ප්‍රඥාවෙන් පූර්ණ විය. දෙවියන් වහන්සේගේ ප්‍රසාදය ද උන් වහන්සේ කෙරෙහි විය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.